# ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ බෞද්ධ සම්ප්‍රදායයන් අතර පවතින විසංවාදය : ථෙරවාදය, මහායානය සහ තන්ත්‍රයානය ඇසුරෙන්

සුදේශ් දිසානායක[1]

## Abstract

The major Buddhist traditions—Theravada, Mahayana, and Tantrayana—evolved from early Buddhism, adapting their doctrines in response to the varying contexts of time and space as Buddhist philosophy disseminated globally over different periods. Each of these traditions encountered significant challenges in their transformation processes while striving to preserve their philosophical identities. Notably, from certain Buddhist perspectives, the early form of Buddhism exhibited familiarity with women, promoting social and cultural equality. However, interpretations of feminist identity within these major traditions have varied, influenced by the distinct social contexts they have absorbed. This article investigates whether Buddhist traditions differ regarding feminist identity. The central objective is to ascertain the extent to which Buddhist perspectives on feminist identity align with or diverge from principles of gender equality. The findings indicate that Buddhist thoughts on feminist identity are not uniformly aligned with gender equality across different traditions. Despite their adherence to the foundational concepts of early Buddhism, each major tradition manifests its unique interpretation of womanhood, resulting in divergent expressions of feminism.

**Keywords** : *Theravada, Mahayana, Tantrayana, feminist identity, Feminism*

1 තාවකාලික කථිකාචාර්ය, දර්ශන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

## හැඳින්වීම

සිංහල භාෂාවේ කාන්තාව යනුවෙන් හැඳින්වෙන භාෂාමය පදය සඳහා මාතෘ භාෂාවන්හි දී ස්ත්‍රී, නාරි, මනුෂී, මානුෂී, අඞ්ගනා, මහිලා, ස්ත්‍රීජන සහ අබලා (Williams, 1851, 266p.) යනාදි පද භාවිත වේ. 'දරුවන් දරන්නී' (Williams, 2005, 1259p.) සහ පුරුෂ හෝ නපුංසක හෝ නොවූ සත්ත්වයා (සෝරත හිමි, 1956, පි. 1135). යනාදි අර්ථයන්හි ස්ත්‍රී යන පදය භාවිත වේ. කාන්තාව පිළිබඳ දාර්ශනික තේමාවන් හා විශ්ලේෂණයන් ස්ත්‍රීවාදයෙන් දැඩි ව සාකච්ඡා කෙරේ. ස්ත්‍රීවාදය නම් දාර්ශනික සංකල්පනාවේ ප්‍රකටාර්ථය ස්ත්‍රිය හා සම්බන්ධ දාර්ශනික විමර්ශනයන් සිදු කරනු ලබන වාදය යන්නයි. එ නමුත්, මෙම වාදය එම අර්ථමය භාවිතයට සීමා කිරීමට නොහැකි වන්නේ සියලු ප්‍රචණ්ඩත්වයන්ට එරෙහි සමාජ යහපැවැත්ම උදෙසා න්‍යායාත්මක ව මෙන් ම ව්‍යවහාරික ව ද සංවිධාන වූ දාර්ශනික සම්ප්‍රදායක් වශයෙන් දැක්විය හැකි පුළුල් අර්ථයක් මෙහි විද්‍යමාන වන බැවිනි. ස්ත්‍රීවාදයෙන් කිසිවෙකු බැහැර කිරීමක් සිදු නොකරන හෙයින් ඕනෑ ම පුද්ගලයෙකුට ස්ත්‍රීවාදියෙකු වීමේ ගැටලුවක් ද පැන නොනඟී. තවද, කාන්තාවකට පැහැදිලි ව ම ස්ත්‍රීවාදිනියක් වීමට හැකි වුව ද, සෑම කාන්තාවක් ම ස්ත්‍රීවාදිනියක් වශයෙන් සඳහන් කිරීමට නොහැකි ය (Nesta & stewart. 2019, 681p.). එ නම් 'යමෙකු උසස් හෝ පහත් වීමට ජාතිය නො බලපානු ලැබේ' (සු.නි. 1.7.143) යැයි බුදුදහමේ සඳහන් වන පරිදි ම යමෙකුට ස්ත්‍රීවාදියෙකු වීමට ශරීරාඞ්ග ලක්ෂණයන් ගේ ස්වභාවය අදාළ නොවන බැව් පැවසිය හැකි ය.

ස්ත්‍රිය සහ බුදුදහම අතර සම්බන්ධය බුද්ධ චරිතයේ ආරම්භයේ සිට ම දැක ගත හැකි වේ. බෞද්ධ සමකාලීන සමාජය අනෙක් ආගමික සහ දාර්ශනික සංස්ථාවන් සමඟ සංසන්දනය කිරීමේ දී සමාජීය, ආගමික හා සංස්කෘතික නිදහසක් ස්ත්‍රිය කෙරෙහි ලබාදීමට බුදුදහම උත්සහ ගෙන ඇති බැව් ඇතැම් ථෙරී ගාථාවන් (ථෙරී. ගා. 6.2) නිදර්ශන සපයයි. තවද, ස්ත්‍රී ප්‍රව්‍රජ්‍යාත්වය, අග්‍ර ශ්‍රාවිකා පදවි ප්‍රදානය, ඕනෑ ම සමාජ ස්ථරයකට අයත් වූ කාන්තාවකට භික්ෂුණී ශාසනයට පැමිණීමට බාධාවක් නොවීම වැනි නිදර්ශන බුදුසමය සහ කාන්තාව අතර පැවති සම්බන්ධතාවේ ඓතිහාසික අවස්ථාවන් නියෝජනය කරයි.

## පර්යේෂණ ගැටලුව

ස්ත්‍රී අනන්‍යතාව පිළිබඳ බෞද්ධ සම්ප්‍රදායන් අතර විසංවාදයක් පවතී ද? යන්න විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණ

ථේරවාදය, මහායානය සහ තන්ත්‍රයානය යන බෞද්ධ සම්ප්‍රදායන් මඟින් ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ විවිධ දාර්ශනික මතවාදයන් ඉදිරිපත් කරයි. එහෙත් එම සම්ප්‍රදායන්හි එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ දාර්ශනික මතවාදයන් පවතින අතර එම විසංවාදයන් තුලනාත්මක ව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමයට අයත් 'මූලාශ්‍රය පරිශීලන ක්‍රමයෙන්' සිදු කෙරෙන අධ්‍යයනයක් හෙයින් ස්ත්‍රී අනන්‍යතාවයට අයත් බෞද්ධ දාර්ශනික ග්‍රන්ථ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. මෙහි දී, ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායන් තුනට අදාළ ස්ත්‍රීත්වය පිළිබඳ අදහස ආශ්‍රිත ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රයන් පරිශීලනය කෙරේ. තවද, මෙම අධ්‍යයනය සඳහා "Religion of Tibet" ග්‍රන්ථය වැනි ද්විතීක මූලාශ්‍රයන් ද භාවිත කරන අතර එහි දී, විවිධ දෘෂ්ටිකෝණයන්ට අනුව රචිත පඨිත සහ නොයෙකුත් ලිපිලේඛන සැලකිල්ලට භාජනය කෙරේ. මෙම රචනයන්ට අතිරේක ලිපි ලේඛන සහ කෝෂ ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සිදු කෙරේ. මේ සඳහා ප්‍රකාශිත සහ අප්‍රකාශිත මූලාශ්‍රයයෝ මෙන් ම ලිඛිත සහ අන්තර්ජාලයෙන් සහ වෙනත් මාධ්‍යයෙන් ලබාගත හැකි දේශන සහ හඬපට වැනි අලිඛිත මූලාශ්‍රයයෝ ද භාවිත කෙරෙත්.

## සාහිත්‍ය විමර්ශනය

'Feminist Buddhism as Praxis: Women in Traditional Buddhism' යන පඨිතයෙහි දී 'Kawahashi Noriko' යුරෝකේන්ද්‍රීය ස්ත්‍රීවාදය සහ

බුදුදහම අතර සම්බන්ධය විවේචනය කරයි. එය ජපාන බෞද්ධ සමාජය කෙරෙහි අවධානය යොමු කරයි. 'In the Footsteps of the Buddha? Women and the Bodhisatta Path in Theravā?da Buddhism' පර්යේෂණයෙහි දී, බුදුසමය සහ ස්ත්‍රීවාදය අතර සම්බන්ධය සාකච්ඡා කළ ද එය බෝධිසත්ත්ව මාර්ගය සහ ස්ත්‍රිය අතර සම්බන්ධතාවය සැලකිල්ලට භාජනය කරයි. 'පෙරදිග ස්ත්‍රීවාදය' කෘතියෙහි දී සංජීවනී රූපසිංහ ස්ත්‍රීවාදී දර්ශනය සහ පෙරදිග දර්ශනය අතර සම්බන්ධය අධ්‍යයනය කරයි. නමුත් එහි ස්ත්‍රීවාදය හා සම්බන්ධ ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායන් තුන අතර තුලනය නොපෙනේ. විමලඥාණ හිමි විසින් 'තාන්ත්‍රික බුදුසමය' කෘතියෙහි දී තාන්ත්‍රික බුදුසමය සහ ස්ත්‍රීත්වයට අදාළ ඇතැම් සංකල්ප පිළිබඳ ගවේෂණය කළ ද එම කෘතිය තාන්ත්‍රික බුදුසමය කේන්ද්‍රකොට ඇත.

**සාකච්ඡාව**

ත්‍රිපිටකාගත බුදුසමයෙහි ස්ත්‍රිය පිළිබඳ විවිධ ප්‍රවේශයන් හා අවස්ථාවන් මත පදනම් වූ පරස්පර විරෝධී (මෙය ඉදිරියේ දී සාකච්ඡා කරනු ලැබේ.) මතවාදයන් ඉදිරිපත් වීම දැකිය හැකි අතර, එය පසු කාලීන බෞද්ධ සම්ප්‍රදායන් ගේ ස්ත්‍රිය පිළිබඳ ස්ව මත සාධනය මෙන් ම පර මත ඛණ්ඩනය කෙරෙහි ද බලපා ඇත. මුල් බුදුදහමේ ස්ත්‍රිය පිළිබඳ ප්‍රකාශයන් මූලාශ්‍රය කොට ගත් ඉගන්වීම් පසු කාලීන ව විවිධ කාල අවකාශයන්ට සහ සමාජ සංස්ථාවන් ගේ ස්වරූපයන්ට යටත් ව නොයෙක් ස්වරූපයන්ගෙන් වර්ධනය වීමක් දැකිය හැකි වේ. නූතනයේ දී, ස්ත්‍රිය පිළිබඳ මතවාදයන්ට අදාළ ප්‍රධාන බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන් තුනක් පෙනේ. මෙම ප්‍රවේශයන් මෙසේ දැක්විය හැකි ය.

- හීනයානය (ථේරවාදය)
- මහායානය
- තන්ත්‍රයානය (Dalai Lama & Nagarjun, 1987, 10p.).

මෙම බෞද්ධ සම්ප්‍රදායන් අතර කිසිදු අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් නැතැයි කිසිසේත් ම ප්‍රකාශ කළ නොහැකි ය. (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 09). තවද, පොදුවේ ගත් කල්හි, මෙම සම්ප්‍රදායන්හි මූලික අරමුණ නිර්වාණය සාක්ෂාත් කර ගැනීම වුව ද, අභ්‍යන්තරාගත දාර්ශනික සංකල්පයන් ගේ අන්‍යෝන්‍ය ප්‍රතිරෝධතාවන් මෙන් ම,

ආවසානික නිෂ්ඨාව ලබා ගන්නා මාර්ගයේ විශේෂ වෙනසක් දැකිය හැකි වේ. (Goodman, Ethics in Indian and Tibetan Buddhism, 21th Nov. 2023). පීටර් ඩෙල්ලා ගේ අදහසට අනුව මහායානය කොටස් ද්වයකට වර්ග කොට දැක්විය හැකි අතර එය පාරමිතායානය සහ වජ්‍රයානය (මන්ත්‍රයානය) වශයෙන් දැක්විය හැකි ය. තවද, මෙම සම්ප්‍රදායන් ද්වයෙහි වෙනස පවතින්නේ එහි දාර්ශනික මූලාරම්භයේ හෝ අවසානයේ නො ව විධික්‍රමයේ (methodology) බැව් ඩෙල්ලා කල්පනා කරයි. (Della Santina, P. 1997, 232p.). රාධාකෘෂ්ණන්ට (2014) අනුව හීනයානය බුදුන් වහන්සේ ගේ මුල් ධර්මය නියෝජනය කරන අතර එය බුද්ධිවාදී ශාසනික හා උග්‍ර ආචාරවාදී ලක්ෂණ ආරක්ෂා කරන්නක් වශයෙන් හැඳින්විය හැකි ය. තවද, මහායානය ධ්‍යාන යෝගී දේව ධර්මයක් සහ භක්තිවාදයක් දියුණු කරන්නක් වශයෙන් සඳහන් කළ හැකි වේ. තාන්ත්‍රික බුදුසමය වශයෙන් දැක්වෙන වජ්‍රයානය හෝ මන්ත්‍රයානය ඉන්දියාවේ සහ ලංකාවේ විවිධ නිකායන් වශයෙන් පළමුවෙන් ම විද්‍යමාන ව ඇත. (Vajrayana (Tantric or Esoteric) Buddhism, Britannica, 21th Nov. 2023). තවද, මහායානයේ භක්තිවාදය පදනම් කොට ගත් විමුක්ති ක්‍රමය තාන්ත්‍රික සමයට මාර්ගෝපදේශ සැපයූ බව රාධාකෘෂ්ණන් ගේ (2014) අදහසයි. තාන්ත්‍රික බුදුසමය මහායානයේ එක් ප්‍රවේශයක් වශයෙන් සඳහන් කිරීමට හැකි වුව ද, එහි අන්තර්ගතයෙහි නොයෙක් වෙනස් දාර්ශනික සන්දර්භයන් ඇති හෙයින් (Berzin, A, Study Buddhism, 21th Nov. 2023). මෙම අධ්‍යයනයෙහි දී, එය මහායානයෙන් වෙනස් වූ බෞද්ධ දාර්ශනික ප්‍රවේශයක් වශයෙන් සැලකේ. එමෙන් ම, මෙම දාර්ශනික සම්ප්‍රදායන්හි පවතින විවිධත්වය මූලික බෞද්ධ සාරය කෙරෙහි විරුද්ධත්වයක් නො සැපයුව ද 'ස්ත්‍රීත්වය' නැමති සමාජීය සහ සංස්කෘතික සංකල්පය කෙරෙහි අන්‍යෝන්‍ය ප්‍රතිවිරෝධතා ප්‍රස්තුතගත කොට ඇත.

## පුද්ගල අනන්‍යතාවය

වාසෙට්ඨ සූත්‍රයේ දී, බුදුන් වහන්සේ ප්‍රායෝගික උදාහරණ භාවිත කරමින් දේශනා කරනු ලබන්නේ ක්‍රියාව (කම්ම) මත ඇතමෙක් බ්‍රාහ්මණයෙකු වන බවත්, උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙකු හෝ අබ්‍රාහ්මණයෙකු නො වන බවත් ය. (සු.නි. 3.9.655). එහි දී, පූර්ණ

වශයෙන් ජාතිවාදයට විරුද්ධ වීමක් දැකිය හැකි වේ. කුලවාදය පිළිබඳ අදහස් සපයන මලලසේකර සහ ජයතිලක ගේ අදහස වන්නේ බුද්ධ ධරමාන සමයේ බෞද්ධයන් සමාජයේ මිනිසා එක සමාන බව ඔප්පු කිරීමට වෑයම් කොට ඇති බවයි. (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 66). කොන් කිරීම තුළ ගැබ්ව ඇති අන්තවාදී සාරයන් (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 40). යන භාවිතය ම ස්ත්‍රීන් වෙන් කොට සැලකීමෙහි අන්තර්ගත වන හෙයින් ජාති වාදයේ හෝ කුල වාදයේ වෙනත් ස්වරූපයක් වශයෙන් ස්ත්‍රී අනන්‍යතා මර්ධනය දැක්විය හැකි වේ. එනම්, ස්ත්‍රිය ස්ත්‍රියක් වීම මත සාමාන්‍ය වර්ගයකට අයත් පුරුෂයන් ලක්වන පීඩනයන්ට අමතර ව පවුල, ජාතිය හෝ කුලය ඇතුළත සිදුවන වෙනත් ආන්තිකකරණයන් ද විඳීමට සිදු වේ. උදාහරණයක් වශයෙන් දක්වන්නේ නම්, කිසියම් සමාජ කණ්ඩායමක් (A) තවත් සමාජයක් (B) විසින් ආන්තිකකරණයට ලක් කරන්නේ නම් එම සමාජ කණ්ඩායමට (A) අයත් සෑම පිරිසකට ම පොදුවේ සමාජ පීඩනයන් විඳීමට සිදු වේ. මෙයට අමතරව, 'A' කණ්ඩායම තුළ පවතින පුරුෂ ආධිපත්‍යයෙන් ස්ත්‍රී ආධිපත්‍ය මර්ධනය කිරීම ද සිදු වේ. මේ නිසා, ස්ත්‍රිය ජාතිය හෝ කුලය වැනි ප්‍රපඤ්ච මත පීඩනයට ලක්වන අතර ම ස්ත්‍රී අනන්‍යතාවය ඇතැම්විට කාන්තා මර්ධනයට හේතුවක් වේ. මේ නිසා කිසිවෙක් කිසිවෙකු සමාජයෙන් හේතු යුක්ති රහිත ව බැහැර කිරීමට කටයුතු කරන්නේ නම් බුදුසමය එයට පැහැදිලි විරෝධයක් දැක් වූ බව විග්‍රහ කිරීමට හැකි වේ. තවද, ඇතැම් සන්දර්භයන්හි දී, මෙම 'වෙන් කොට සැලකීමට' විරුද්ධ වීමේ බෞද්ධ මතවාදය ස්ත්‍රීන් කෙරෙහි ද භාවිත කොට ඇතැයි උපකල්පනය කිරීමට හැකි ය.

බෞද්ධ විග්‍රහයට අනුව මනුෂ්‍ය ප්‍රතිලාභය දුර්ලභ වූවකි. (සීමවිසොධනී, පරි.5). එය එසේ හෙයින් මනුෂ්‍ය වර්ගයට ගැනෙන ස්ත්‍රිය ගේ උත්පත්තිය ද දුර්ලභ වූවක් නො වේ යැයි පැවසීම අතාර්කික වූවකි. ඇතැම් ස්ත්‍රීන් පුරුෂයන්ට වඩා නුවණවත් (මේධාවිනි) සහ සිල්වත් (සීලවතී) වන අතර ඔවුන් පෝෂණය කළ යුතු (සං. නි. 1.3.6. 127). යැයි බුදුන් වහන්සේ කොසොල් රජුට දේශනා කොට ඇත. මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ බුදුදහම ස්ත්‍රී අනන්‍යතාවය සදාචාරාත්මකව සුරක්ෂා කිරීම සහ කාන්තාව කෙරෙහි සමාජමය උසස් තත්ත්වයක් ලබා දීමට

උත්සහ ගෙන ඇති බවයි. එහෙත් අට්ඨකථාවෙහි දක්වා ඇත්තේ මහත් සත්කාර ලබන ලද මල්ලිකාව පුතෙකු නො ලබන ලද හෙයින් ඒ සියලු සත්කාර නැති වීමට ආසන්න බවයි. තවද, 'සෙය්‍යා' යන පදයන්ට අර්ථය සපයන අර්ථකථාව අඥාන (දන්ධපඤ්ඤ) සහ කථා කිරීමට ද අසන්නට ද නොහැකි තැනැත්තන්ට (එලමූගපුත්තතතො) වඩා ස්ත්‍රිය උසස් (සං.නි.අ.1.3.6.127). බැව් දක්වයි. ටීකාවෙහි (සං.නි.ටී. 1.3.6.127). මෙයට අදාළ විශේෂ විස්තරයක් සඳහන් නො වේ. අටුවාවේ විස්තරයෙහි දී ස්ත්‍රිය පිළිබඳ ඇගයුම කිසියම් ආකාරයක පහත් ස්ථරයක සිට විග්‍රහ කොට ඇති බව පෙනෙන්නේ මෙම සිදුවීමට අදාළ සමාජයේ ස්ත්‍රිය පහත් කොට සැලකීම දක්වා ඇති හෙයිනුත් එම සමාජීය මතවාදයෙන් මිදීමට අටුවා විග්‍රහය අසමත් ව ඇති හෙයිනි. එනම්, ගොළු බිහිරි පුද්ගලයන් හා සම්බන්ධ තුලනයෙන් පෙනෙනුයේ ස්ත්‍රී අනන්‍යතාවය පරීක්ෂා කිරීමේ දී භාෂාමය ක්‍රීඩාවක (Language games) නියුක්ත ව සිට ඇති බවකි.

ස්ත්‍රී සහ පුරුෂ ලිංග නිර්මාණය වීම පිළිබඳ ත්‍රිපිටකාගත බුදුසමයේ පැහැදිලි කරනු ලබන්නේ ආහාරයකට ගන්නා ලද ඇල් වී (සාලිං) සහ පූර්ව ආත්මයන්හි සිටි ස්ත්‍රී පුරුෂ භාවය ඒ සඳහා හේතු වන බවයි. (දී. නි. 1.126). මෙය භෞතික කාරණා (අල් වී) මෙන් ම පූර්ව ආත්ම තත්ත්වයන් ගේ ස්වරූපයන් ගේ (කර්මය) මිශ්‍රණයක් ලෙස පැහැදිලි ව උපකල්පන කිරීමට හැකි වේ. මෙයට අදාළ අර්ථකථා විග්‍රහයෙහි දී ස්ත්‍රී ලිංග ප්‍රාදූර්භූත වීම කර්මය මත පදනම් ව විග්‍රහ කොට ඇත. එහි දී, ස්ත්‍රියක් පුරුෂයෙකු වීමට පුරුෂත්ව ප්‍රත්‍ය ධර්ම (පුරිසත්තපච්චය ධම්ම) පූරණය කිරීම මෙන් ම පුරුෂයෙක් ස්ත්‍රියක වීමට ප්‍රධාන සාධකය 'කාමමිත්‍යාචාරය' බැව් දැක්වේ. (දී.නි.අ.3.4.126). එහි ටීකාවේ දී එම දෘෂ්ටිකෝණයේ දිගුවක් දැකිය හැකි වේ. මෙහි දී පුරුෂයා උත්තම සහ ශ්‍රේෂ්ඨ වන අතර කාන්තාව නො බැබළෙන තැනැත්තියක් වශයෙන් නොයෙක් කරුණු සඳහන් කරමින් මතවාදයක් ඉදිරිපත් කරයි. (දී.නි.ටී.3.126). මෙම ව්‍යාඛ්‍යානයන්ට අනුව ස්ත්‍රිය සහ පුරුෂයා අතර පැහැදිලි වෙනසක් දැකිය හැකි වේ. එම විග්‍රහයන්ගෙන් ප්‍රකාශ කළ හැකි වන්නේ මනුෂ්‍යාත්ම භාවය දුර්ලභ වන අතර පුරුෂ ආත්ම භාවය ඉතා දුර්ලභ වන බවයි. එ නමුත් ඉහත දක්වන ලද මල්ලිකා සූත්‍රයේ දැක්වෙන විග්‍රහය සහ දීඝ නිකාය අටුවා විස්තරය

අතර පැහැදිලි අර්ථ විපර්යාසයක් පෙනේ. එයට හේතුව නම්, ඇතැම් ඥානවන්ත සහ සීලවන්ත ස්ත්‍රීන් ඇතැම් පුරුෂයන්ට වඩා උසස් වීමේ සදාචාරාත්මක වටිනාකමක් මල්ලිකා සූත්‍රයේ ඉදිරිපත් වන අතර එම විග්‍රහයට අනුවා අර්ථ විශ්ලේෂණය වෙනස්වන හෙයනි. තවද, මෙම ප්‍රවේශද්වය එකවර පිළිගැනීමෙන් අර්ථමය විසංවාදයක් නිර්මාණය වීම වැළැක්විය නො හැකි ය. එයට හේතුව වන්නේ උපතින් ලබන සමාජ තත්ත්වයන් මත කිසිවෙකු ශ්‍රේෂ්ඨ නොවන බව බුදුන් වහන්සේ අනුදත් බැවිනි. (සු.නි.3.9). තාන්ත්‍රික බුදුසමයට අයත් සූත්‍රයක් වන හේවජ්‍ර මහා තන්ත්‍රය තුළ දී ස්ත්‍රිය හා පුරුෂයා අතර සහ-සම්බන්ධතාවය පිළිබඳ නව්‍ය මතවාදයක් ප්‍රකාශයට පත් කරයි. එහි දැක්වෙන පාඨය මෙසේ ය.

''ස්ත්‍රීන් සඳහා ඇත්තේද, පුරුෂයන් සඳහා ඇති ලක්ෂණමය, ඔවුන්ද මෙම කුලයන්ට අයත් වන්නේ සම්මුති ස්වරූපයෙනි.'' (හේවජ්‍ර මහා තන්ත්‍රය, 2009, පි. 130).

මෙහි සඳහන් වනු ලබන්නේ ස්ත්‍රී සහ පුරුෂ යන වර්ගීකරණයන් සමාජ නිර්මිතයන් බව ය. ඒ හෙයින්, එහි ස්ත්‍රී සහ පුරුෂ ලක්ෂණයන්හි වෙනසක් නො දැක් වේ. සමාජ සහ සංස්කෘතික පැනවීම් යථාර්ථය වශයෙන් ගනිමින් ස්ත්‍රී හෝ පුරුෂ විරෝධයක් නිර්මණය කිරීමට මෙම සූත්‍රය වෑයම් කොට නොමැත. මෙයට සමාන විග්‍රහයක් අංගුත්තර නිකායේ පඨම බන්ධන සහ දුතිය බන්ධන සූත්‍රයන්හි දැක් වේ. එහි දී පිළිවෙළින් ස්ත්‍රිය පුරුෂයා බන්ධනය කර ගැනීම සහ පුරුෂයා විසින් ස්ත්‍රිය බන්ධනය කරගැනීම දක්වා ඇත. එම සූත්‍ර ද්වයට අදාළව ප්‍රකාශ කළ හැකි වන්නේ කාන්තා සහ පිරිමි යන දෙ පිරිස නොයෙකුත් කරුණු මත එකිනෙකා සමඟ බැඳීම් නිර්මාණය කරගන්නා බවයි. එහි දී, එක් පිරිසක් හීන නොවන බවයි. එමෙන් ම, එක් පිරිසක් උසස් වන්නේ නම් තවත් පිරිසක් හීන හෙවත් පහත් වන අතර එය ම වාර්ගිකත්වයට අදාළ ගැටලු නිර්මාණය කරයි. එ නමුත්, අංගුත්තර නිකායේ පඨම සහ දුතිය බන්ධන සූත්‍රයෙහි දී ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට අදාළ චිත්තාවේගයන් පොදුවේ විග්‍රහ කරයි.

ටිබෙට් බුදුදහමෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් නම් සංකේතකරණයයි. පීටර් ඩෙලාර්ට අනුව මෙම සංකේතකරණය මුල් බුදුදහමට ආගන්තුක නො වන්නක් වන අතර ම 'ධර්මය' නිරූපණය

කිරීම සඳහා 'චක්‍රය' ද ඇතැම් තැනක මධ්‍යම ප්‍රතිපදාව විග්‍රහ කිරීම සඳහා වීණාව ද භාවිත කොට ඇත (Della Santina, P, 1997, 235p.). සංකේතකරණයේ පවතින ගැඹුරු ස්වභාවය පශ්චාත් කාලීන බෞද්ධ සම්ප්‍රදායන්හි ස්ත්‍රිය සහ පුරුෂයා සම්බන්ධ කොට නිරූපණය කිරීමක් පැහැදිලි ව දැකගත හැකි වේ. එහි දී කාන්තාව පිළිවෙළින් ප්‍රඥාව, ශූන්‍යත්වය හා නිර්වාණයෙහි ද පිරිමියා කරුණාව, රූපී බව සහ සංසාරයෙහි ද නිරූපණයක් වශයෙන් සංකේතගත කොට ඇත. (විමලඥාණ හිමි, 2014, පි. 128). තවද, ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය පද්මය සහ වජ්‍රය මගින් ද සංකේතවත් වේ. (සාරානන්ද හිමි, 2019, පි. 51). මෙම එක් එක් සංකේතයන්ගෙන් නිරූපිත ස්ත්‍රිය සහ පුරුෂයා වෙන් වෙන් වශයෙන් ගත් කල්හි ද්වෛතමය වර්ගීකරණයක් උත්පාදනය වීම සාමාන්‍යයෙන් සිදු වේ. එහි දී, එක් ප්‍රපඤ්චයක් අනෙක් ප්‍රපඤ්චයෙන් පැහැදිලි ව වෙන් කිරීම හෙවත් හුදෙකලා කිරීමක් සිදු වේ. එ නමුත් මැණික් සමඟ කඳින් වෙන් කළ හිස් කිහිපයක් සහ ආශාව උපදවන කාන්තා රූප සමඟ මළමිනී තාන්ත්‍රික බුදුසමයේ දක්වා තිබීමෙන් (Della Santina, 1997, 262p.). එක් එක් නිරූපණයන් එකිනෙකින් වෙන් කිරීම වෙනුවට ප්‍රතිබද්ධ කිරීමක් මෙම සම්ප්‍රදායිකයන් අපේක්ෂා කොට ඇති බැව් පැහැදිලි ව පෙනේ.

ස්ත්‍රී පුරුෂ සම්භෝගය නිරූපිත ප්‍රතිමාවන් තාන්ත්‍රික බුදුසමයේ සාමාන්‍ය වූවක් වීමෙන් පෙනීයන්නේ ද්වෛතවාදයට මෙය සීමා කිරීමට නොහැකි බවයි. විමලඥාණ හිමි ගේ අදහස වන්නේ මෙම නිරූපණයන් ද්වෛතවාදය ඉක්මවා යෑමක් (විමලඥාණ හිමි, 2014, පි. 127) ලෙසිනි. එ නමුත් ඒ හිමියෝ කුමන ආකාරයේ ඉක්මවා යෑමක් දැයි පැහැදිලි ව අවධාරණය නො කරති. පීටර් ඩෙල්ලා ද විවිධ සංකේතයන් හි නිරූපිත වීම් පිළිබඳ අදහස් දැක්වීමේ දී උක්ත අදහස ඉදිරිපත් කරයි. එනමුත් සංකේතකරණය තේරුම්ගත හැකි වන්නේ මෙම සමාජ සන්දර්භයට අයත් වෙනත් දර්ශනයන් ආශ්‍රයෙනි. තාඕ දර්ශනයට අනුව පවසන්නේ නම් අන්‍යෝන්‍ය ප්‍රතිපක්ෂ බව හේතු කොටගෙන ඇතිවන ඒකීයභාවයක් වශයෙන් මෙය පැවසිය හැක. (ස්වභාවයේ ස්වභාවය, 2021, පි. 70). අන්තර්පරායත්ත භාවයක් මේ සංකේත දෙක තුළ පැවතීම මෙයට හේතුවක් ලෙස පෙනේ. රූපසිංහ ගේ ප්‍රකාශයකින් මෙය වඩා පැහැදිලි කළ හැක. එනම් 'දැඩි දරුඳඬු

පුරුෂ ස්වභාවය තුළ මෘදු මොලොක් ස්ත්‍රී ස්වභාවයක් ද අඩංගු ව ඇත. මෘදු මොලොක් යැයි සම්මත ස්ත්‍රී ස්වභාවය තුළ හැඩි දැඩි රළු පුරුෂ ස්වභාවයක් ද අධ්‍යාහාර වේ.' (රූපසිංහ, 2017, පි. 202). මෙම ස්වභාවය තාන්ත්‍රික බුදුදහමේ දැක්වෙන ස්ත්‍රී සහ පුරුෂ අන්තර් පරායත්ත බවට අදාළ වේ. මෙහි දී පැහැදිලි වන්නේ පුරුෂයා ගේ හෝ ස්ත්‍රිය ගේ කේවල හෙවත් හුදු ස්වායත්ත පැවැත්මක් වෙනුවට එකිනෙකා සමඟ සහබද්ධ පැවැත්මක් තන්ත්‍රයානිකයෝ ප්‍රකාශ කිරීමට උත්සහ ගෙන ඇති බවයි.

ස්ත්‍රී පුරුෂ අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධතාවය ප්‍රකාශ කෙරෙන්නක් ලෙස වජ්‍ර යෝගිනිය සහ හේරුක යන දෙදෙනා පිළිබඳ තාන්ත්‍රික සංකල්පනාව දැක්විය හැකි ය. හේරුක යනු බෝධික ශක්තියේ ධනාත්මක පුරුෂ අංශයේ යෝගික පුද්ගලත්වාරෝපණය වන අතර වජ්‍ර යෝගිනය එහි ස්ත්‍රී ඍණාත්මක අංශයේ පුද්ගලත්ව ආරෝපණයයි. තවද, බෝධික ශක්තියේ මෙම උභයාංගයන් එක් එක් වශයෙන් වෙන් කළ නොහැකි ය. (එවන්ස්, 2011, පි. 90). මෙහි පවතින සුවිශේෂි දෙය නම්, ස්ත්‍රී උපසංකල්පය ඍණාත්මක වුව ද සමස්තයෙන් වෙන් කොට විශ්ලේෂණ කිරීමට නොහැකි වීමයි. පුරුෂ උපසංකල්පය ධනාත්මක වුව ද එය ප්‍රධාන නොවීම මෙහි අනෙක් වැදගත් ලක්ෂණයක් වන අතර බෝධික ශක්තියේ එක් අංගයක් අනෙකෙන් ව්‍යුක්ත කිරීමට නොහැකි වීම සමස්තයේ පැවැත්මට උභයාංගය ම අවශ්‍ය වීම පෙන්නුම් කරන්නකි. මේ හෙයින් සමස්ත සංකල්පය ලක්ෂණ වශයෙන් වෙන් කොට දක්වන්නේ නම් එහි පැවැත්ම නිශේධන වන බැව් ගම්‍ය වේ. එමෙන් ම, මෙම සංකේත මගින් ස්ත්‍රිය පිළිබඳ උසස් භව්‍යතාවන් නිරූපණ කිරීමෙන් පෙනෙන්නේ ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ ධානාත්මක ඇගයුම එම සමාජයට ආගන්තුක නොවන බවයි. එය යම් සේ ආගන්තුක වූයේ නම්, නව සංකල්පයකින් ගැඹුරු බෞද්ධ ධර්මයක් පැහැදිලි කිරීමට අවස්ථාවක් පැවතිය නොහැකි ය.

ස්ත්‍රිය සහ පුරුෂයා පිළිබඳ වෙනස් මතවාදයක් ඉදිරිපත් කරන මෙම සම්ප්‍රදායන්හි 'ස්ත්‍රී අනන්‍යතාව' වෙනස් ආකාරයකට විග්‍රහ කරන අතර ම 'පුරුෂ අනන්‍යතාවයට' හානියක් සිදු නො කිරීම ධනාත්මක ලක්ෂණයකි. තවද, මෙම සම්ප්‍රදායන් කාන්තාව පිළිබඳ

බුද්ධිමය අනන්‍යතාවන් නිර්මාණය කරගනු ලබන්නේ පුරුෂයා පිළිබඳ පෙර පැවති විශ්ලේෂණයන් ආධාරයෙනි. අවලෝකිතේශ්වර බෝසතුන් මුල දී පිරිමි වී පසු ව කාන්තා දෙවඟනක් බවට පත් ව ඇත. (කාරියවසම්, 1999, පි. 107). තාන්ත්‍රික සම්ප්‍රදාය තුළ කාන්තාවට අවකාශයක් නිර්මාණ කිරීමට කාන්තා මෙන්ම පිරිමි දේව මණ්ඩලය ද උපකාර කොට ඇත (Irons, E. A. 2008, 564p.). පිරිමි සංකල්ප හා විශ්ලේෂණ, කාන්තාව පිළිබඳ ඥානමය අවලෝකනයන් උත්පාපනය කිරීමට හේතුවීම මෙන් ම ආධාර කිරීම පුරුෂත්වය නිශේධන කිරීමක් නොවන අතර කාන්තාවට සම තත්ත්වයන් ලබාදීම නිරූපණ කිරීමක් වශයෙන් දැක්විය හැකි ය.

## සදාචාරාත්මක අනන්‍යතාවය

බුදුදහමේ විනය ශික්ෂාවන් පැනවීමේ මූලික අරමුණ නම් සංඝ සමාජය සංවිධානාත්මක ව පවත්වා ගෙන යෑමයි. එය පාරාජිකා පාළියේ සඳහන් වන ශික්ෂාපද පැනවීමේ අරමුණු දහයෙන් (පාරා.පා. 2.39). පැහැදිලි වේ. කාන්තාව සංඝ සමාජයේ සාමාජිකාවක් වන හෙයින් ස්ත්‍රියට අදාළ ප්‍රඥප්තීන් පැනවීමක් දැකිය හැකි වුව ද පුරුෂයාට සාපේක්ෂව ප්‍රමාණාත්මක වෙනසක් එහි දැකිය හැක. තවද, සංඝ සමාජයට ඇතුළත් වීමේ දී අනුගමනය කළ යුතු ගරුධර්ම අෂ්ටකයක් ද පාලි ත්‍රිපිටකයේ දැක්වේ. බුදුදහම ශික්ෂාවන් පැනවීම උපමාවක් ඇසුරින් දක්වන්නේ විලක ජලය ඉක්ම වීම වැළැක්වීම සඳහා ඉවුරක් බැඳීමට ය. (අං.නි. 8.6.1.1). එනම් බුද්ධ ශාසනයේ නාශනය වැළැක්වීම ප්‍රඥප්ති පැනවීමේ අරමුණ වේ. ශික්ෂා පැනවීම පිළිබඳ එඩ්වඩ් අයිරන්ස් ගේ අදහස වන්නේ භික්ෂුණියට සංඝයා සමඟ තම අප්‍රධාන සම්බන්ධතාවය පවත්වාගෙන යෑමට සහ භික්ෂුණීන්හට භික්ෂූන් කෙරෙහි කිසිදු කලෙක අධිකාරියක් නො දැක්වීමයි. තවද, අනෙකුත් ශික්ෂා පද මගින් තමන් ගේ අධිකාරිය දූෂ්‍ය කිරීම වැළැක්වීම මෙන් ම කාන්තාව ගේ තත්ත්වය උසස් කිරීම සහ ඔවුන් ගේ අධ්‍යාත්මික සමානාත්මතාවය හඳුනා ගැනීම ය. (Irons, 2008, 502p.). මෙය නූතන දෘෂ්ටිකෝණයට අනුව ස්ත්‍රිය සමාජයේ සීමාකරණයකට ලක් කොට ඇති බැව් දක්නට ලැබුණ ද, බුද්ධ ධරමාන සමයට සාපේක්ෂ ව බලන කල්හි කාන්තාවට තම හිමිකම් ලබා දීමට සහ එමගින් සිදුවන අගතීන් සීමා කිරීමට දායකවීමක් ලෙස දැක්වීම යුක්ති යුක්ත වන්නේ

කාන්තාවට සදාචාරාත්මක අනන්‍යතාවය පිළිබඳ බුදුදහම අවධාරණ කොට පැවතීමත් එය ලබාදීමට කටයුතු ආරම්භ කිරීමත් නිසා ය.

ස්ත්‍රිය සහ පුරුෂයා පිළිබඳ උසස් සහ පහත් වශයෙන් ඇගයුම් කරණයක් බෞද්ධ ව්‍යාඛ්‍යාන සාහිත්‍යයෙහි ඉදිරිපත් කොට ඇත. පුරුෂයා ශ්‍රේෂ්ඨ (සෙට්ඨං) වන (දී.නි.ටී. 3.126). අතර ස්ත්‍රී ලිංගිකයන් හීන (ඉත්ථි ලිඞ්ග ඤ්ච හීනං) වශයෙන් (ම්.නි.අ. 3.2.5.130). දැක්වෙන මෙම විග්‍රහයට අනුව ස්ත්‍රිය පුරුෂයාට සාපේක්ෂ ව පහත් ඇගයුමකින් යුක්ත වූවෙකු බව දැක්වේ. ත්‍රිපිටක බුදුදහම තුළ දී මෙම දෘෂ්ටි කෝණයට අවශ්‍ය මූලයන් දැකිය හැක. 'සියලු ගංගාවන් වක්‍ර වූ ස්වභාවය ඇත්තේ යම් සේ ද, සියලු ම කාන්තාවන් අවස්ථාව ලද පමණින් වරදෙහි බැඳේ' (ජා.පා.2.21.536.309). යන්න මෙයට නිදර්ශන වේ. මෙහි දැක්වෙන විග්‍රහයට සමස්ත ස්ත්‍රී (සබ්බත්ථියො) වර්ගයා ම ඇතුළත් කොට ඇති බැවින් පොදුවේ ස්ත්‍රිය සදාචාරාත්මක දූෂ්‍යතාවයකින් යුක්ත වේ ය, යන පදනම මත සිට කාන්තාවන් ඇගයීම, ඔවුන් ගේ ප්‍රතිරූපයට කිසියම් ආකාරයක හානිදායක තත්ත්වයන් නිරූපන කිරීම සාමාන්‍යයෙන් සිදු වේ. එ නමුත් මෙහි දැක්වෙන විග්‍රහය මුල් බුදුසමයේ ස්ත්‍රිය පිළිබඳ ආකල්පය සමඟ අනුබද්ධ වන්නේ ද යන්න ගැටලු සහගත වේ. මේ සඳහා බලපානු ලබන එක් කරුණක් නම් ඇතැම් ස්ත්‍රීන් පුරුෂයන්ට වඩා නුවණවත් (මේධාවිනි) සහ සිල්වත් (සීලවතී) වන අතර ඔවුන් පෝෂණය කළ යුතු (සං.නි. 1.3.6.127). යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කොට තිබීමයි. මල්ලිකා සූත්‍රයේ ප්‍රකාශය සත්‍ය වන්නේ නම් කුණාල ජාතකයේ ප්‍රකාශය සත්‍ය විය නොහැකි වන්නේ 'ඇතැම් ස්ත්‍රීන්' ශීලවන්ත සහ ඥානවන්ත වීමත් 'සියලු ස්ත්‍රීන්' ශීලවන්ත නොවීමත් නිසා ය. සියලු ස්ත්‍රීන් යන්න තුළ ඇතැම් ස්ත්‍රීන් ඇතුළත් වන බැවිනි. මෙම ප්‍රකාශ දෙක අතාර්කික වන අතර ම උග්‍ර තාර්කික දෝෂයන්ගෙන් යුක්ත වන්නේ එක් සන්දර්භයක මෙම ප්‍රවේශ දෙක භාවිත කළ නො හැකි නිසාවෙනි. තවද, මෙය බුදුන් වහන්සේ සකස් කොට මනාව ධර්මය දේශනා කරයි යන ඛෙත්තූපම සූත්‍රයේ විශ්ලේෂණය සමඟ ද සමපාත නො වේ. (සං.නි. 4.8.7). අනෙක් කරුණක් නම් වර්තමානයේ දැකිය හැකි සමස්ත ත්‍රිපිටකය අවධි කිහිපයක් ඔස්සේ වර්ධනය වී තිබීමයි. මෙම වර්ධනයේ දී සමකාලීන මතවාදයන් ඒ ඒ ආචාර්යීය වාද

හරහා බුදුදහමට ඇතුළත් විය නොහැකි යැයි පැවසීම ප්‍රායෝගික නොවන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ නො වීමත් වාචනා මාර්ගයෙන් එය පවත්වා ගෙන පැමිණීමත් නිසා ය. තවද, උක්ත මතවාදය මුල් බුදුසමයේ සහනශීලී ආකල්පයට වඩා සමීප වන්නේ අට්ඨ කථාවන් මගින් නිරූපණය කොට ඇති ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිකෝණයටයි.

නොයෙක් ජාතීන්ට සහ කුලයන්ට අයත් කාන්තාවන් බුදුසමය සමඟ කටයුතු සිදු කිරීම සහ ඇතැම් පිරිස් ප්‍රව්‍රජ්‍යාත්වයට පත්වීමෙන් පෙනීයන්නේ බුදුදහම කාන්තාවන්ට සදාචාරාත්මක සංවර්ධනයක් ලබා ගැනීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කොට ඇති බවයි. මේ පිළිබඳ ජයතිලක සහ මලලසේකර ගේ අදහස වන්නේ මෙම සංවර්ධනයන් ජන්මයේ අනුග්‍රහය පදනම් කොට නො ගත්තක් වන අතර සියල්ලට සදාචාරාත්මක සංවර්ධනයන් ලබා ගැනීමට ඉඩ ඇති අතර ම එය සියල්ලට ම ලබා ගත හැකි බවයි. මොවුන් මෙය කාන්තාව හා සම්බන්ධ කොට විශේෂයෙන් ප්‍රකාශ නො කරන්නේ වුව ද මෙම විග්‍රහය කාන්තාවන්ට ද අදාළ වන්නේ කාන්තාවන් ද මනුෂ්‍ය වර්ගයට අයත් වන බැවිනි. බුදුදහම තම උසස් නිෂ්ඨාව කාන්තාවන්ට ලබා ගැනීමට අවහිර නො කර තිබීමෙන් (අං.නි. ගොතමී සුත්ත) ද පෙනෙන්නේ සදාචාරාත්මක සංවර්ධනය බුදුදහම අවධාරණ කොට තිබීමයි.

ආචාරවිද්‍යාව අතින් ථේරවාදීන් ගේ අදහස වන්නේ අරහත් බව ලැබීම වන අතර මහායාන පරමාදර්ශය වන්නේ බෝධිසත්ත්වභාවය ලැබීමයි (රාධාකෘෂ්ණන්, 2013, පි. 525). ථේරවාදයෙහි මෙතෙක් ලොව පහළව ඇත්තේ එක් බෝසත්වරයෙකු වන (ධර්මසිරි, 1996, පි. 111). අතර මහායානය එක් බෝසත්වරයෙකුට සීමා නො වේ. මහායානිකයෝ මෙම සදාචාරාත්මක උත්තරීතරභාවය කාන්තාවන්ට ලබාදීමට කටයුතු කරති. මේ සඳහා එක් නිදර්ශනයක් වශයෙන් 'තාරා' සංකල්පය දැකිය හැකි ය. 'තාරා' දෙවඟන බෝධිසත්ත්වවරියෙක ලෙස නම් කළ හැකි වන්නේ ඇය බෝධිසත්ත්ව අවලෝකිතේශ්වර ගේ ස්ත්‍රී ප්‍රතිරූපය (Tara, britanica, 11th Nov. 2023). වන බැවිනි. මහායානයෙහි දී තම දර්ශනයයේ උත්තරීතර තත්ත්වය කාන්තාවන්ට ලබා දීමට පෙළඹී ඇත. මෙහි දී කාන්තාව පුරුෂයා හා සමාන කොට

සලකා ඇති බැව් පෙනේ. රාධාකෘෂ්ණන්ට අනුව මහායානිකයන් ගේ සදාචාරය මිනිස් ධර්මය සහ සර්ව මනුෂ්‍ය විමෝචන දෘෂ්ටිය පැරණි බුදුදහමේ පිළිවෙළට සැසඳේ (රාධාකෘෂ්ණන්, 2013, පි. 527-8) යැයි පැවසිය හැකි ය. එයට හේතුව නම් සදාචාර සංකල්පයන්හි වාර්ගිකත්වය ඉස්මතු නො වීමට මහායානිකයෝ වෑයම් කිරීමයි.

## බුද්ධිමය අනන්‍යතාවය

කාන්තාව සතු ඥානමය ශක්තිය පිළිබඳ පැහැදිලි සාධක ථේරී ගාථාවන්ගෙන් හමු වේ. එහි පුණ්ණා තෙරණිය තත් කාලීන සමාජයේ බුද්ධිමය අධිකාරිය දරන ලද බ්‍රාහ්මණයෙකු සහ ඔහු ගේ 'උදක ශුද්ධිය' නැමති ක්‍රියාව ආනුභූතික කරුණු මත පදනම් ව තාර්කික ව ප්‍රතික්ෂේප කරති. (ථෙරිගාථා, 12. 1). මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර ඛේමා තෙරණිය අග්‍ර වීම (අං.නි. 1.14.236). කාන්තාව ගේ ප්‍රඥාවන්ත භාවය පිළිබඳ බුදුන් වහන්සේ පිළිගෙන තිබූ බව ප්‍රකාශ කෙරෙන අවස්ථාවකි. බුදුන් වහන්සේ ඛේමා සහ උප්පලවන්නා තෙරණියන් මෙන් වීමට භික්ෂුණීන්ට දේශනා කරන අතර එය භික්ෂුණීන් ගේ මනා ප්‍රාර්ථනාවන් අතර එකකි. (අං.නි. 2. 12.2). තවද, පැරණි බුද දහම විවිධ හැකියාවන් සහිත භික්ෂුණීන් සහ උපාසිකාවන් පිළිබඳ ධනාත්මක ආකල්පයක් දැක්වීමෙන් පෙනෙනු ලබන්නේ, ඔවුන් සතු ව පැවති විවිධ හැකියාවන් සංවර්ධන කිරීමට මුල් බුදුසමය අවකාශ සපයා ඇති බවයි.

සංඛතමය හෙවත් ප්‍රපඤ්චමය භාෂාව හරහා නිශ්ප්‍රපඤ්චමය 'නිර්වාණය' විග්‍රහ කිරීම අතිශය අපහසු කාර්යයක් වේ. පුද්ගලයෙකු ගේ පැවැත්මේ අවසානය යනු ආත්ම විමුක්තිය (Cao, 2015). යනුවෙන් සරල ව දැක්විය හැකි වුව ද මෙම සරල විග්‍රහය අතිශය සංකීර්ණතා රාශියක් නිර්මාණ කරනු ලැබේ. තාන්ත්‍රික සූත්‍රයක් වන විමලකීර්ති නිර්දේශ සූත්‍රය දී ශාරිපුත්‍ර තෙරුන්ට ප්‍රකාශ කළ නො හැකි වූ නිර්වාණයේ ස්වභාවය පිළිබඳ ගැටලුව එක් දේවතාවියක් විසඳයි. 'විමුක්තිය යනු සෑම දෙයක ම ඇති සමතාවයයි' (විමලකීර්තිනිර්දේශ සූත්‍රය, 2006, පි. 95). යනාදි ඇය ගේ විග්‍රහය අවසානයේ, දෙ පිරිස ම එකඟතාවයකට පත් වේ. දේවතාවිය කාන්තාවක් වීමෙන් පෙනෙන්නේ ඥානමය අධිගමනයන් සාක්ෂාත් කරීම සඳහා ස්ත්‍රීත්වය

යන භෞතික සාධකය කෙරෙහි තාන්ත්‍රික බුදුදහමේ දී සෘණාත්මක අවධානයක් යොමු කොට නොමැති බවයි. තවද, රූපසිංහ ගේ අදහස වන්නේ, මහායානයෙහි දී ස්ත්‍රී ප්‍රඥාව ඉතා උසස් ලෙස දක්වන්නේ පරමාර්ථමය තත්ත්වය ස්ත්‍රීත්වය හා සම්බන්ධ කිරීම සහ එම පරමාර්ථමය තත්ත්වය ස්ත්‍රී මූල ධර්මයක් වීම හේතු කොට ගෙන බවයි. මෙම දෘෂ්ටිකෝණයට අනුව ප්‍රකට වන්නේ ස්ත්‍රීත්වය නැමති සංකල්පයේ පවතින සියල්ල ඉවසීමේ ස්වභාවය හෙවත් නො ගැටීමේ ස්වභාවයයි නැතහොත් සමතාවයයි.

## උසස් අධ්‍යාත්මික සහ බලමය අනන්‍යතාවය

බුදුදහමේ අධ්‍යාත්මිකත්වයේ ආවසානික අවස්ථාව නිර්වාණය වන අතර අරහත්, පච්චේක බුද්ධ සහ සම්මා සම්බුද්ධ යනුවෙන් විමුක්තිය සාක්ෂාත් කිරීමට හැකි ප්‍රධාන මාර්ග හෙවත් යානත්‍රයක් ත්‍රිපිටක බුදුදහමේ මෙන් ම මහායාන දර්ශනයෙහි (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 2003, පි. 61). විග්‍රහ වේ. මෙම තත්ත්වය ලබා ගැනීමට පුද්ගලයා ගේ බාහිර සාධකයන් නොබලපාන බව මලලසේකර සහ ජයතිලක ගේ අදහසයි. ඔවුන් පවසන්නේ ජාතිය හෝ කුලය කුමක් වුව ද මුක්තිය ලබා ගැනිමේ හැකියාව සෑම මිනිසා තුළ ම දැකිය හැකි අතර ඔවුන් ආගම අනුසාරයෙන් සොයන්නේ ද සදාකාලික සැපත බව ය. (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 73). මෙම උසස් අධ්‍යාත්මික තත්ත්වය ලබා ගැනීමට ස්ත්‍රී-පුරුෂ භාවය, උසස්-පහත් වීම, සහ දුප්පත්-පොහොසත් වීමාදි කාරණා බලපා නොමැති බවට ථේර සහ ථේරී ගාථාවන් තුළ අවශ්‍ය ප්‍රමාණයට නිදර්ශන දැකිය හැකි ය.

ත්‍රිපිටකාගත බුදුදහම ඇතුළු අට්ඨකථා විග්‍රහයන් ශ්‍රාවක යානය හරහා ස්වකීය විමුක්තිය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ විරෝධතාවයක් නො දැක් වුව ද, අරහත් මාර්ගය නොවන අනෙකුත් මාර්ග ද්වය හරහා ස්ත්‍රියට නිර්වාණය දැකීම සීමා කිරීමට උත්සහ ගෙන ඇත. මේ ලොව සිදු වීමට නොහැකි හෙවත් අවකාශ නැති කාරණා අතර එකක් වශයෙන් ස්ත්‍රියකට සම්‍යක් සම්බුද්ධත්වයට පත් වීමට නොහැකි අතර පුරුෂයෙකුට පමණක් අවකාශ ඇති බව බහුධාතුක සූත්‍රයෙහි සඳහන් වන (ම.නි. 3.2.5.130). අතර එහි අටුවාවෙහි මෙම මතයට අවශ්‍ය සාධක ඉදිරිපත් කෙරේ. එයට අනුව, ස්ත්‍රියකට බුද්ධත්වය

ලබා ගැනීමේ ප්‍රණිධාන (ප්‍රාර්ථනා) මාත්‍රයකුදු නො ලැබිය හැකි ය (ම.නි.අ.4. 130). එයට ප්‍රධාන හේතුව ලෙස අටුවා දක්වන්නේ බුද්ධවංසයේ අට වැදෑරුම් ප්‍රණිධානයන් හා සම්බන්ධ ගාථාවකි. ලිංග සම්පත්තිය (බු. වං. 2.59). එම කරුණු අතර එකකි. ලිංග සම්පත්තිය නම් පුරුෂ භාවය යැයි මජ්ඣිම නිකාය ටීකාවේ දැක් වේ. (ම.නි.ටී. 3.2.5.130). තවද, අටුවාව සඳහන් කරනු ලබන්නේ 'බුද්ධත්වය සඳහා අවශ්‍ය ප්‍රාර්ථනාවන් (ප්‍රණිධාන) සම්පාදනය කිරීමට අසමත් ස්ත්‍රිය කෙසේ නම් බුද්ධත්වයට පත්වේ ද?' යනුවෙන් ස්ත්‍රී බුද්ධත්වයට අවශ්‍ය අවකාශය ආවරණ කරමිනි. තවද, මෙහි දැකිය හැකි සුවිශේෂි කරුණ නම් මෙම ප්‍රකාශය සිදු කරනු ලබන භාෂා මාධ්‍යයි. එහි දී, අටුවා ඇදුරු ස්ත්‍රී බුද්ධත්වය යන කරුණ හස්‍යෝත්පාදනයක් නැතහොත් අවඥාසහගත මෙන් ම හාස්‍ය කරුණක් ලෙස දැක්වීමයි. මෙය භාෂාමය උපක්‍රමයක් වශයෙන් පමණක් අවලෝකනය කළ හැකි වන්නේ එම ප්‍රකාශයෙන් ඉදිරිපත් වන ඇඟවීම නිශේධනාත්මක වන බැවිනි.

ස්ත්‍රී බුද්ධත්වය පිළිබඳ සන්දර්භයේ දී, තාන්ත්‍රික බුදුසමය ථේරවාදීන් ගේ සංවෘත ස්වභාවයට වඩා විවෘත ස්වරූපයක් ඉදිරිපත් කරයි. විමල කීර්ති නිර්දේශ සූත්‍රයේ ශාරිපුත්‍ර ස්ථවිරයන් ගේ ස්ත්‍රීත්වය පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු සපයන දේවතාවිය  බුදුන් වහන්සේ ගේ ප්‍රකාශයක් ආශ්‍රයෙන් සඳහන් කරන්නේ 'සෑම දෙයක් තුළ ම පුරුෂභාවයක් හෝ ස්ත්‍රී භාවයක් හෝ ඇත්තේ නැත.' (විමලකීර්ති නිර්දේශ සූත්‍රය, 2006, පි. 99). යනුවෙනි. එම සූත්‍රයෙහි ම සඳහන් වන්නේ, ඒ ඒ යානයන්හි පවතින ලක්ෂණ සහ ඇය සතු ලක්ෂණ අනුව දේවතාවිය අයත් වන යානය පිළිවෙළින් ශ්‍රාවක යානය, පසේ බුදුවරුන් ගේ යානය සහ මහා යානයට ය. (විමලකීර්ති නිර්දේශ සූත්‍රය, පි. 96). තවද, සම්‍යක් සම්බුද්ධත්වය යන්න පවතින්නේ සම්‍යක් සම්බුද්ධත්වය කියා තත්ත්වයක් නැති නිසා (විමලකීර්ති නිර්දේශ සූත්‍රය, පි. 101). යනුවෙන් එම සූත්‍රයෙහි දීර්ඝ විශ්ලේෂණයකින් යුක්ත වේ. වජ්‍රයානයෙහි ස්ත්‍රී බුදුවරියන් විශාල ප්‍රමාණයක් ද සිටී (රූපසිංහ, 2017, පි. 221). මේ හෙයින් තාන්ත්‍රික බුදුසමය ශාරීරික අංග ලක්ෂණ බුද්ධත්වය සඳහා ආරෝපණ නො කොට ඇති බැව් පෙනේ. ජයතිලක සහ මලලසේකර ගේ අදහස වන්නේ සියලු ම සචේතන සත්ත්වයෝ ම 'බුද්ධාංකුර'

වන්නේ බුද්ධ ස්වභාවය ඔවුන් තුළ විද්‍යමාන වන හෙයිනි (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 46). මෙයින් පෙනෙන්නේ බුද්ධත්වය පිළිබඳ සන්දර්භයේ දී මහායානිකයන් වාර්ගිකත්වය පදනම මත සිට බුද්ධත්ව සාක්ෂාත්කරණය විවරණය නො කොට ඇති බවයි.

බුදුදහමේ දැක්වෙන උසස් බලමය ස්ථර අතර චක්‍රවර්ති භාවය, ශක්‍ර, මාර සහ බ්‍රහ්ම යනාදිය උසස් තත්ත්වයන් වශයෙන් දැක්විය හැකි වන්නේ මෙම තත්ත්වයන්ට සාම්‍ය වන වෙනත් බලමය තත්ත්වයන් දෘශ්‍යමාන නො වන හෙයිනි. චක්‍රවර්ති රාජ්‍යත්වය හැර අනෙක් බලමය තත්ත්වයන් මනුෂ්‍ය ලෝකය ඉක්ම වූවක් වන අතර ඒ සියල්ල එම බල ධාරාවන්ට අයත් ලෝකයෙහි අධිපති බලය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන ඒවා වේ. පොදුවේ මෙම සියල්ලෙහි බල දරනය පුරුෂත්වය මත පදනම් වන බැව් ත්‍රිපිටක බුදුසමයෙහි දැක් වේ. බහුධාතුක සූත්‍රයෙහි දැක්වෙන මෙම විග්‍රය අටුවාවෙහි සවිස්තරාත්මක ව විභාග කොට ඇත. ස්ත්‍රිය චක්‍රවර්ති රජු වීමට අසමත් වන්නේ, කොපුව තුළ සැඟ වුණ පුරුෂ නිමිත්ත (කෝසෝහිතවත්ථගුය්හතා) නො පිහිටීම, ස්ත්‍රී රත්නයා ගේ අභාවයෙන් සප්ත රත්නය අසම්පූර්ණ වීම, සක්විති ආදි ස්ථාන ත්‍රය උතුම් වීම සහ ස්ත්‍රී ලිඞ්ගය පහත් වීම යන කරුණු මතය. මෙම විග්‍රහයන් මඟින් සුපැහැදිලි වන දෙය නම්, පූර්ණ සත්ත්වයෙකුට පමණක් ඉහත දක්වන ලද බලමය තත්ත්වයන් ග්‍රහණ කිරීමට හැකියාවක් පවතින බවයි. මෙ වැනි උත්තම තත්ත්වයන් ලැබීමට කාන්තාව අසමත් වන්නේ ඇය සතු අභ්‍යන්තර මනෝමය ගතිකත්වයන් මත නො ව බාහිර සාධක මතයි. තවද, මෙම අටුවා විස්තරයෙන් පෙනෙනු ලබන්නේ උත්තම හෙවත් පරිපූර්ණ සත්ත්වයෙකු පිළිබඳ මතවාදයක් ථේරවාදීන් නැතහොත් තත් අර්ථකථාචාර්යවරයා විශ්වාස කොට ඇති බවයි. මේ හෙයින් පූර්ණ මනුෂ්‍ය තත්ත්වය කාන්තාවන්ට ආවර්ණ වූ දෙයක් ලෙස පැහැදිලි ව උපකල්පන කළ හැකි වන්නේ උත්තර සහ උසස් බලාධිකාරයන් දැරීමට කාන්තාව නුසුදුසු යැයි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයන්හි සඳහන් කොට ඇති බැවිනි.

ස්ත්‍රිය පිළිබඳ සන්දර්භයේ දී, බ්‍රහ්ම ලෝකය පිළිබඳ ථේරවාද විග්‍රහය අතිශය වැදගත් වේ. බ්‍රහ්ම ස්වරූපය පිළිබඳ අටුවා විස්තරයට අනුව

පැවසිය හැකි වන්නේ ලිංග භේදයක් බ්‍රහ්ම ලෝකයේ නැති බවයි. ඒ නිසා පුරුෂයෙකු බ්‍රහ්ම බවට පත් වන්නේ හෝ නො වන්නේ යැයි පැවසිය නොහැකිය. එ නමුත් මහා බ්‍රහ්මයෙකු ලෙස උත්පත්තිය ලැබිය හැක්කේ මෙහි (මනුෂ්‍ය ලෝකය හෝ පූර්ව ආත්ම භාවය) සිටි පුරුෂයෙකු පමණි. කාන්තාවකට බ්‍රහ්ම පිරිවර (බ්‍රහ්මපාරිසජ්ජ) සමඟ එකතු විය හැකි වුව ද මහා බ්‍රහ්ම විය නොහැකි ය. තවද, උභය ලිංග ස්වභාවයන් අප්‍රකට වුව ද බ්‍රහ්මයන් තුළ පුරුෂ ලකුණු මිස ස්ත්‍රී සලකුණු දැකිය නොහැකි (ම.නි.අ. 3.2.5.130). බැවි දැක්වෙන මෙම විවරණයෙන් කාන්තාවට මහා බ්‍රහ්ම තත්ත්වයට පත් වීමට නොහැකි බැව් පැහැදිලි ය. එ නමුත් අටුවාචාරීන් දක්වන කාරණා අතර කාන්තා හෝ පිරිමි ලකුණු නැති ස්ථානයක පුරුෂ ආකෘතීන් පැවතිය හැකි යැයි යන්න අතාර්කික වේ. තවද, බ්‍රහ්ම ස්වරූපය මිනිස් ස්වභාවයෙන් දැක් වීමට යෑමේ දී ඇති වන ගැටලු ඌනනය කිරීමට මෙම විශ්ලේෂණ ක්‍රමය භාවිත කරන ලද්දේ වුව ද එහි යුක්ත යුක්ති භාවය පිළිබඳ විසංවාදයන් ඇති වීම වැළැක්විය නොහැකි ය. බ්‍රහ්මාත්ම භාවය ලැබීමට පෙර පූර්වාත්ම භාවයේ පුද්ගලයා සතු භෞතික හෙවත් ලිංග ස්වරූපය මහා බ්‍රහ්ම හෝ බ්‍රහ්ම පාරිසජ්ජ යන වර්ග දෙකෙන් එකකට අන්තර්ගත වීමට හේතුවක් වන බව අර්ථ කථාවට අනුව දැක්විය හැකි ය. එය එසේ වන්නේ නම්, ත්‍රිලක්ෂණය වැනි බෞද්ධ මූලික ඉගැන්වීමකින් මෙම තාර්කික ප්‍රස්තුතය සනාථ කිරීමට නොහැකි වන්නේ ස්ත්‍රී ආත්මයක ස්ථීරතාව පිළිගැනීමට නොහැකි බැවිනි.

**කාලමය සහ අවකාශමය අනන්‍යතාවය**

සමාජමය ප්‍රපඤ්චයන් නිර්මාණ වනු ලබන්නේ කිසියම් කාලමය හා අවකාශමය අවශ්‍යතාවයන් පරිපූර්ණ කිරීමට ය. ඇතැම් සම්මුතීන් සමාජ අවශ්‍යතාවන් පවත්වාගෙන යෑමට අසමත් වීමේ දී එය නිශේධන වීමත් තවත් සමාජීය ප්‍රතිපත්ති සමඟ ඉදිරියට ගමන් කිරීමත් සමහර ප්‍රඥප්තීන් නැවත පැනවීමත් නිසාවෙනි. වර්තමානයේ මෙන් ම පැරණි ආසියාතික බොහෝ සමාජයන්හි ප්‍රතිපත්තීන් සහ නිර්ණායක නිර්මාණ කිරීමෙහි ලා බුදුසමයෙන් ලැබී ඇති දායකත්වය අතිවිශාල වේ. බුදුදහම පැරණි භාරතීය සමාජය පුනරුත්ථාපන කිරීමට අවශ්‍ය නව්‍ය ක්‍රමවේදයක් ඉදිරිපත් කොට ඇතැයි පැවසීම අතිශයෝක්තියක්

නො වේ. මෙසේ පැවසීමට හැකි වන්නේ, නූතනයේ දී විශ්වීය සමාජය හැඩගැසීම කෙරෙහි ලා බෞද්ධ දර්ශනයෙන් ලැබෙන පිටුබලය සුළුපටු නො වීම නිසා වෙනි. නූතනය කෙබඳු බලපෑමක් සිදු කළ ද බුදුසමය නිර්මාණ වූ සමාජයට බුදුදහම අතිශය වැදගත් වන්නේ බෞද්ධ දර්ශනය බිහි වන්නේ පැරණි භාරතීය අවශ්‍යතාවන් පූර්ණ කිරීමට හෙයිනි.

ස්ත්‍රියට ආගමික නිදහස සහ අනෙකුත් ඇතැම් සමාජීය අවශ්‍යතාවන් සාමාර්ථනය කිරීමට අවශ්‍ය අවකාශයක් උත්පාදනය කිරීමට බුදුන් වහන්සේ කටයුතු කොට පැවතිය ද බෞද්ධ දර්ශනයෙහි ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ ගැටලුව කෙරෙහි සමාජීය, සංස්කෘතික හා දේශපාලනික සන්දර්භයට අයත් ගැඹුරු දාර්ශනික විශ්ලේෂණ සහ ප්‍රතිමාන නිර්මාණයක් සිදු කොට නොමැත. ඇතැම්විට, බුදුසමය පැන නැගි අවධිය වනවිට සමාජයේ කුල මානය පිළිබඳ ගැටලු (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 50). පැවති හෙයින් බුදුන් වහන්සේ ගේ ධර්මයෙහි ස්ත්‍රී අනන්‍යතාවයට වඩා වැඩි අවධානයක් කුල ප්‍රශ්නය කෙරෙහි යොමු කරන්නට ඇතැයි උපකල්පන කළ හැකි ය. එ නමුත්, එම අවධියට අයත් කාල අවකාශයෙහි ස්ත්‍රිය කෙරෙහි පැවති ඍණාත්මක ආකල්පය වෙනුවට බුදුදහම ධනාත්මක අදහස් දැරීම සුවිශේෂී වන්නේ ස්ත්‍රී විරෝධී සමාජයක් තුළ කාන්තා හිමිකම් වෙනුවෙන් පෙනී සිටි සහ පුරුෂයාට සමාන වරප්‍රසාද ලබා දීමට කැප වූ දර්ශනවාදයක් ලෙසිනි. මේ සඳහා ස්ත්‍රී ප්‍රව්‍රජ්‍යත්වය නිදර්ශනයක් වේ. ත්‍රිපිටක බුද්ධ ධර්මයට අනුව කාන්තා පැවිද්ද පිළිබඳ ව පැවසිය හැක්කේ හැල් කෙතක වී බෝල් වන රෝගය (සෙතට්ඨිකා) ද වැඩුණු උක් හේනක කාමඤ්ජෙට්ඨික (මඤ්ජෙට්ඨිකා) රෝගය ද ඇති වීමෙන් සමස්ත කෙත විනාස වී යන්නා සේ කාන්තා පැවිද්ද හේතුවෙන් බුද්ධ ශාසනය ද වර්ෂ පන්දහසකට සීමා වන බවයි. (අං.නි.8.6.1.1). එ නමුත් බුද්ධ ශාසනයේ සිදු වූ විප්ලවීය පරිවර්තනයක් වශයෙන් කාන්තා පැවිද්ද නම් කළ හැක්කේ පුරුෂාධිපත්‍ය දැඩි ව පැවති සමාජයක කාන්තාවට සංඝ සමාජයේ හිමිකම් ලබා දී ඇති හෙයිනි. මේ නිසා, කාලයන් සහ අවකාශයන් ද්වයක සිට බුද්ධ ශාසනයේ දිගු කාලීන පැවැත්ම ඡේදනය වීමට කාන්තාව හේතුවේ යැයි පැවසිය නො හැකි ය. අවකාශ ද්වය පටලා ගැනීමෙන් බුදුදහමේ කාන්තාව පිළිබඳ

ආකල්පය පැහැදිලි ව ග්‍රහණය කර ගැනීමට නොහැකි වේ.

ථේරවාදී බුදුදහම පිළිබඳ රාධාකෘෂ්ණන් ගේ ස්ථාවරය නම් බුදුදහම ලොව පුරා ව්‍යාප්ත වීම මත හීනයානයට ක්‍රියාත්මක වීමට නොහැකි වූ අතර හීනයානිකයන් සතු තපස් බවින් තොර පරමාදර්ශයක් ලෝකයට අවශ්‍ය වී ඇති බවයි. මෙම තපස් බව පිළිබඳ හේතුව මත සිට ථේරවාදීන් ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ සිතන්නට ඇතැයි සිතිය හැකි වන්නේ බ්‍රහ්ම චර්යාවට ස්ත්‍රිය බාධාවක් ලෙස උපකල්පන කරන්නට ඇති බැවිනි. උප්පථ සූත්‍රයේ දැක්වෙන 'ඉත්ථීමලං' යන්නට අටුවා විස්තරය වන්නේ 'කාන්තා අපිරිසිදුකාරකයෙන් (මල) දූෂ්‍ය වූ තැනැත්තා පිරිසිදු කිරීමට නොහැකි (සං.නි.අ. 1.6.8.58). බවයි. මෙම ස්ථාවරය භාවනා ක්‍රමය අනුදත් සම්ප්‍රදායක පිළිගැනීම් සමූහයට සාධාරණ වන බැවින් එම ක්‍රමය අනුගමනය කරන්නට ථේරවාදීන් උත්සහ ගෙන ඇතැයි සිතිය හැක. එ නමුත් මෙම දෘෂ්ටිකෝණයෙහි ප්‍රතිවිරුද්ධ පක්ෂය එනම් කාන්තාවක් මෙම ක්‍රමයට අනුව තම විමුක්තිය සාක්ෂාත් කරන්නට වෑයම් කරන්නේ නම් ඇය ගේ අපිරිසිදු කාරකය (මල) කාන්තාවක විය නොහැකි ය. මෙම ස්ථාවරයේ දී ථේරවාදී ස්ථාවරය විසංවාදයකට ලක්වීම වැළැක්විය නොහැකි වන්නේ කාන්තාවකට කාන්තාවක් ම බ්‍රහ්මචර්යාවට අදාළ දූෂ්‍ය කාරණය යැයි පැවසිය නොහැකි හෙයිනි. තවද, තත් කාලීන සමාජ සංස්කෘතික සංස්පර්ශය මෙන් ම භූගෝලීය පිහිටීම හෙවත් ආසන්න අවකාශයන්හි සමාජීය සම්බන්ධතා ථේරවාදී මතය නිර්මාණය වීමෙහි ලා බලපා ඇති බව සඳහන් කිරීමට හැක. ථේරවාදය සමාජීය හා සංස්කෘතික කරුණුවල දී නිහඬ වීමක් හෝ එයට විරුද්ධ වීමක් දක්වා නොතිබීමෙන් පෙනී යන්නේ එක්කෝ එම සමාජයෙහි ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ ගැටලුව සාමාන්‍ය වීමයි. නැතහොත් එම සමාජයන්ට අනුවර්තනය වූ ථේරවාදය බුදුදහමට අනුව සමාජ ශෝධනයක් කිරීමට අකමැති වීම හෝ සමාජ විපර්යාසයක් සිදු කිරීමට නොහැකි බලයකින් යුක්ත වීම මත පසුබැසීමයි. තවද, ථේරවාදීන් ගේ ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ විශ්ලේෂණයන් තේරුම් ගත යුත්තේ නූතන ලෝක දෘෂ්ටිකෝණයට අන්තවාදී වූවක් වශයෙන් දෘශ්‍යමාන වුව ද අන්තවාදී වූවක් ලෙස නොව, එම කාල සහ සමාජ අවශ්‍යතාවයට අනුව ය. මලලසේකර සහ ජයතිලක ගේ අදහස වන්නේ දකුණු ඉන්දියාව සහ ලංකාව අතර

දැඩි සංස්කෘතික සහ සමාජීය සම්බන්ධයක පැවතීම (මලලසේකර සහ ජයතිලක, 2012, පි. 98-99). ලංකාවේ සමාජ ව්‍යුහය නිර්මාණ වීම කෙරෙහි ඉන්දීය බලපෑමේ එක් අවස්ථාවක් ලෙසිනි. එය එසේ නම් ලංකාව ථේරවාදී මතයට අනුව තම දාර්ශනික මතවාදයන් ඉදිරිපත් කරන බැවින් ස්ත්‍රී අනන්‍යතාවය පිළිබඳ ථේරවාදී ආකල්පය නිර්මාණ වීම තනි මතයකට හෝ කරුණකට සීමා කිරීමට නොහැකි බැව් මනා ව පැහැදිලි වේ.

දක්ෂිණ ප්‍රදේශයට ව්‍යාප්ත වූ ථේරවාදයේ සමාජීය අවකාශයට වෙනස් වූ අවකාශයන් කරා තන්ත්‍රයානය සහ මහායානය ව්‍යාප්ත ව ඇත. මහායානය උත්තර ප්‍රදේශය හරහා ව්‍යාප්ත වීමත් එහි එක් ශාඛාවක් වන තාන්ත්‍රික බුදුසමය ටිබෙටය කරා ව්‍යාප්ත වීමත් දැකිය හැක. පළමු ටිබෙට් බෞද්ධ සිද්ධස්ථානයන් පිළිබඳ ඓතිහාසික තොරතුරු ලැබෙන්නේ ත්‍රි සොංට්සේන් (Tri songdetsen) අධිරාජ්‍යයා ගේ කාලයේ දී වන අතර ටිබෙට් බෞද්ධ සම්ප්‍රදායන් නිර්මාණ වීමෙහිලා නාගර්ජුන, ආර්යදේව සහ ශාන්තිදේව යනාදි බෞද්ධ උගතුන් ගේ පිටු බලය දැඩි ව ලැබී ඇත්තේ එම උගතුන් විසින් රචිත කෘති මත ටිබෙට් අධ්‍යයනයන් පදනම් වීමෙනි. (kapstein, 2021). තවද, ටිබෙට් බෞද්ධ අධ්‍යයනයෙහි දී කණ්ඩායමක් ලෙස සලකා ස්ත්‍රීත්වය කෙරෙහි සිදු කෙරෙන එළඹුම ආගමික හෝ වාර්ගික සහ දේශපාලනික අනන්‍යතාවන් මගින් අන්තර්ග්‍රහන ව ඇත. (Janet and Havnevik, 2005, p.172). ටිබෙටය ශිෂ්ටත්වයෙන් තොර රටක් ලෙස සැලකීමට පෙළඹිය හැකි බැව් හජිමේ නකමුර (නකමුර, 2003, පි. 352). ප්‍රකාශ කළ ද චාර්ල්ස් බෙල් ගේ අදහස වන්නේ යුරෝපයෙහි කිසිදාක දක්වන දෙයට වඩා ටිබෙට් කාන්තාවන් ගේ තත්ත්වය ස්ථිරසාර ව ම උසස් බවයි. (Bell, 1992, 26p.). තාඕ වැනි චීන දර්ශනයන් ගේ බලපෑමෙන් තොර ව මහායාන දර්ශයන්ට දිගු කල් පැවතීමට නොහැකි වන්නේ බෞද්ධ නො වන එම දර්ශනයන් චීනය වැනි රටවල මුල් බැස ගෙන පැවතීම හේතුවෙනි. හොඳ හෝ නරක වූ සමාජයක් බලහත්කාරයෙන් වෙනස් කිරීමට තැත් කිරීම නිසඟයෙන් ම වේදනා සහගත වන (විජයවර්ධන, 1964, පි. 162) බැවින් මහායානිකයන්ට බුදුදහම ව්‍යාප්ත වූ නව්‍ය දේශයන්හි පැවති පැරණි ජන විශ්වාසයන් සංශෝධන සහිත ව පිළිගැනීමට මෙන් ම තම සම්ප්‍රදායන්ට අන්තර්ග්‍රහන කර ගැනීමට

සිදු වූ බැව් සිතිය හැක. බුදුදහමේ නව්‍යකරණය පිළිබඳ රාධාකෘෂ්ණන් (2013, පි. 517). ගේ අදහස වන්නේ, මිනිසුන් ගේ සිත් දිනා ගැනීමට පැරණි බුදුදහමේ පැවති දරදඬු බව අත්හැර දමා මිනිස් හදවතට එකඟ වන ආගමක් නිර්මාණය කිරීමට මහායානිකයන්ට සිදු වූ බවයි. මෙය ම කාන්තාව ගේ අනන්‍යතාවය පිළිබඳ සන්දර්භයේ දී භාවිත කොට ඇතැයි සිතිය හැකි වන්නේ තාරා දෙවඟන වැනි බෝධිසත්ත්වවරියන් මහායාන සම්ප්‍රදායෙහි පැවතීම හේතුවෙනි.

## නිගමනය

බුදුන් වහන්සේගේ දර්ශනය සමාන්‍යයෙන් බුද්ධ ධරමාන සමයේ ද විශේෂයෙන් බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ද විවිධ කාලාවකාශයන්ට අනුගත වී ඇත. එහි බලපෑම බෞද්ධ දාර්ශනික මූලධර්ම කෙරෙහි ද අදාළ වේ. ථේරවාදය, මහායානය සහ තන්ත්‍රයානයෙහි කාන්තාව පිළිබඳ අදහස්හි විවිධ ස්වභාවයක් ගනු ලැබුව ද එය කාලය සහ අවකාශයේ විවිධත්වය මත නිර්මාණය වන වෙනස්කම් ලෙස දැකිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

එවන්ස් වෙන්ට්ස්, ඩබ්. වයි. (2011). ඥානමාර්ගයඃ සයවිධ ධර්මයන්ගේ යෝග විද්‍යාව. (ඩබ්. ඇම්. ගුණතිලක, පරි.). නුගේගොඩඃ සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.

කාරියවසම්, ටී. (1999). චීන බුදුදහමට පෙරවදනක්. කොළඹඃ සදීපා පොත්හල.

ධර්මසිරි, ගුණපාල. (1996). බෞද්ධ සාදාචාරයේ මූලධර්ම. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නකමුර, හජිමේ. (2003). පෙරදිග මිනිසුන් ගේ චින්තන විධි ඃභාරතය චීනය තිබ්බතය ජපානය. (පී. බී. මීගස්කුඹුර, පරි.) බොරලැස්ගමුව ඃ විසිදුනු ප්‍රකාශන.

මලලසේකර, ගුණපාල., සහ ජයතිලක, කේ. එන්. (2012). බුද්ධාගම සහ ජාති ප්‍රශ්න. රාජගිරියඃ කුරුළු පොත් ප්‍රකාශකයෝ.

රාධාකෘෂ්ණන්, එස්, (2013). ඉන්දීය දර්ශනය. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රූපසිංහ, එස්. (2017). පෙරදිග ස්ත්‍රීවාදය. කර්තෘ ප්‍රකාශන.

විජයවර්ධන, ජස්ටින්. (1964). තිබ්බතයේ බෞද්ධ මානව සංහාරය. කොළඹ: ස්වස්තික මුද්‍රණාලය.

විමලකීර්ති නිර්දේශ සූත්‍රය. (2006). (ගුණපාල ධර්මසිරි. සහ ඩබ්. ඇම්, ගුණතිලක අනු.). කර්තෘ ප්‍රකාශන.

විමලඤාණ හිමි, එන්. (2014). තාන්ත්‍රික බුදුසමය. කර්තෘ ප්‍රකාශන.

සාරානන්ද හිමි, ඊ. (2019). තන්ත්‍රයානය වජ්‍රයානය සහ ටිබෙට් බුදුසමය. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ස්නෙල්ග්‍රොව්, ඩී. (2009). ශ්‍රී හේවජ්‍ර මහා තන්ත්‍රය. (ඩබ්. ඇම්. ගුණතිලක පරි.). නුගේගොඩ: සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.
ස්වභාවයේ ස්වභාවය. (2021). (ඩබ්. ගුණතිලක. සහ චරිත හේරත් පරි.) කොටුගෙ ාඩ: සහරක්ෂි ප්‍රකාශන.

සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය: කුමාරජීව හිමිගේ චීන පරිවර්තනය. (2003). (ගුණපාල ධර්මසිරි, පරි.). පරිවර්තක ප්‍රකාශයක්.

Bell, C. (1992). Religion of Tibet. New Delhi: Asian educatiional services.

Britannica, T. Editors of Encyclopaedia (2017, October 31). Tara. Encyclopedia Britannica. https://www.britannica.com/topic/Tara-Buddhist-goddess

Britannica, T. Editors of Encyclopaedia (2023, October 6). Avalokiteshvara. Encyclopedia Britannica. https://www.britannica.com/topic/Avalokiteshvara

Britannica, T. Editors of Encyclopaedia (2023, November 24). Vajrayana. Encyclopedia Britannica. https://www.britannica.com/topic/Vajrayana

Cao,t. (2015). Ego transcendence: The connecting agent between Buddhism and Feminism. [Retrieved October 25, 2023 from academia achieve: http://www.academia.edu/resource/work/7694432]

Dachille, R. E. (2007). [Review of the book Women in Tibet]. Buddhist-Christian Studies27, 172-174. https://doi.org.10.1353/bcs./2001.0007.

Dalai Lama .L.X.B., & Nagarjun. (1987). The Buddhism of Tibet: Combined Volume. India: Motilal Banarsidass.

Della Santina, P. (1997). The Tree of Enlightenment: An Introduction to the Major Traditions of Buddhism. Taiwan: Corporate Body of the Buddha Educational Foundation.

Devine, N. & Stewar, G. (2019). Women, philosophy and Education, Educational Philosophy and Theory, 51:7, 681-683, DOI:10.1080/00131857.2018.1493420

Goodman, Charles, "Ethics in Indian and Tibetan Buddhism", The Stanford Encyclopedia of Philosophy (Summer 2021 Edition), Edward N. Zalta (ed.), URL = https://plato.stanford.edu/archives/sum2021/entries/ethics-indian-buddhism/ .

Irons, E. A. (2008). Encyclopedia of Buddhism. United States: Facts on File.

Kapstein, M. T. (2021). Tibet, Buddhist Philosophy in. In Stewart Goetz and Charles Taliaferro (Eds.). The Encyclopedia of Philosophy of Religion,(vol. 4,) Retrieved from https://onlinelibrary.wiley.com/doi/epdf/10.1002/9781119009924.eopr0389 ] on [24/11/2021].

Study Buddhism is a project of Berzin Archives e. V., founded by Dr. Alexander Berzin. -https://studybuddhism.com/en/tibetan-buddhism/spiritual-teachers/shakyamuni-buddha/buddha-in-theravada-mahayana-and-tantra-the-same

Williams, M. M. (2005). Sanskrit-English Dictionary, London: Oxford University press.

Williams, M. M. (1851). English and Sanskrit Dictionary. India: Oxford University Press.